**වර්ෂ 2023 ක් වූ පෙබරවාරි මස 16 වන දින පෙ.ව 10.00 ට පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද මාසික මහා සභා රැස්වීමේ වාර්තාව**

පැමිණීම

01. ගරු සභාපති - ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
02. ගරු උප සභාපති - එච්.ජී නන්දසෝම මහතා
03. ගරු මන්ත්‍රී - වී.මුරලිදරන් මහතා
04. ගරු මන්ත්‍රී - එච්.ජී මහින්ද ගුණසේකර මහතා
05. ගරු මන්ත්‍රී - ශාන්තලාල් පෙරේරා මහතා
06. ගරු මන්ත්‍රී - ජී.එස්.ජී ෆොන්සේකා මහතා
07. ගරු මන්ත්‍රී - එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
08. ගරු මන්ත්‍රී - එස්.ජී.ටී පුෂ්පකුමාර මහතා
09. ගරු මන්ත්‍රී - ටී.ජී.ඩී.සී දමයන්ති මිය
10. ගරු මන්ත්‍රී - එච්.ජී මෛත්‍රීපාල මහතා
11. ගරු මන්ත්‍රී - එච්.ජී.එන්.සී රණසිංහ මහතා
12. ගරු මන්ත්‍රී - එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
13. ගරු මන්ත්‍රී - අයි.රාමකිලි මහතා
14. ගරු මන්ත්‍රී - ජී.ජී.ටී.ජී සිරිසේන මහතා
15. ගරු මන්ත්‍රී - පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
16. ගරු මන්ත්‍රී - එස්.එල්.අරුණ ශාන්ත මහතා
17. ගරු මන්ත්‍රී - එන්.එම් සුසිලා දමයන්ති මිය
18. ගරු මන්ත්‍රී - කේ.ඕ කුසුම්ලතා මිය

නොපැමිණීම

01. ගරු මන්ත්‍රී - කේ.ඕ සෝමතිලක මහතා
02. ගරු මන්ත්‍රී - ජී.කේ.පී ෆොන්සේකා මිය

**01. පසුගිය මහා සභා වාර්තාව සභා සම්මත කිරීම**

ගරු මන්ත්‍රී එස්.ජී.ටී පුෂ්පකුමාර මහතා

2023 ජනවාරි මස මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ජී.එස්.ජී ෆොන්සේකා මහතා

එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව 2023 ජනවාරි මස මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි වාර්තාවක් වශයෙන් සභා සම්මත කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන**

02 - 01 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අධික වර්ෂාව හේතුවෙන් ආපදාවට ලක් වූ පාලම් නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - අවිච්ඡේද කිරීම (ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ප්‍රධාන ලේකම් වෙත යවන ලද ලිපියේ පිටපත) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 02 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ

ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම ස්වාමීන්වහන්සේ වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලින් ටෙම්පල්ස්ටෝවත්ත පොදු වොලිබෝල් ක්‍රීඩා පිටියේ විදුලි සම්බන්ධතාවය ලබා දීම සහ විදුලි බල්බ සවිකර සංවර්ධනය කිරීම සඳහා සභා අරමුදලින් රු. 160,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අදාල ඉල්ලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 – 03 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ

ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම ස්වාමීන්වහන්සේ වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලින් ටෙම්පල්ස්ටෝවත්ත ලකී බෝයිස් ක්‍රීඩා සමාජය වෙත ක්‍රීඩා උපකරණ ලබා දීම සඳහා සභා අරමුදලින් රු. 20,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අදාල ඉල්ලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 04 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ

ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එන්. එම්. එස්. දමයන්ති මහත්මිය වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලින් නාවලපිටිය කහමාන ශ්‍රී රංසිමාලකාරාම විහාරස්ථ පුස්තකාලය සඳහා පොත් රාක්ක හා මේසයක් ලබා දීම සඳහා සභා අරමුදලින් රු. 100,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අදාල ඉල්ලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 05 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ

ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එන්. එම්. එස්. දමයන්ති මහත්මිය වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලින් නාවලපිටිය ශ්‍රී සුන්දරාරාම විහාරස්ථාන මළුවට කැට ගල් ඇල්ලීම සඳහා සභා අරමුදලින් රු. 50,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අදාල ඉල්ලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 06 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ

ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය යටතේ පළාත් පාලන ගරු විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී ජී. එස්. ඒ ෆොන්සේකා මහතා වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන මුදලින් වරකාව ශ්‍රී සුන්දරාරාම විහාරස්ථාන මළුවට කැට ගල් ඇල්ලීම සඳහා සභා අරමුදලින් රු. 100,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අදාල ඉල්ලීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 07 ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, මධ්‍යම පළාත

ප්‍රාග්ධන ආයෝජන වැඩසටහන - 2023 (පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අධික වර්ෂාව හේතුවෙන් ආපදාවට ලක් වූ පාලම් නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - අවිච්ඡේද කිරීම - ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය වෙත යවන ලද ලිපියේ පිටපත) යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදී.

02 - 08 ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාවලපිටිය ශ්‍රී සුන්දරාරාම විහාරස්ථාන මළුවට කැට ගල් ඇල්ලීම සඳහා සභා අරමුදලින් රු. 50,000.00 ක මුදලක් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 09 ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරකාව ශ්‍රී සුන්දරාරාම විහාරස්ථාන මළුවට කැට ගල් ඇල්ලීම සඳහා සභා අරමුදලින් රු. 100,000.00 ක මුදලක් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 10 ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ටෙම්පල්ස්ටෝවත්ත පොදු වොලිබෝල් ක්‍රීඩා පිටියේ විදුලි සම්බන්ධතාවය ලබා දීම සහ විදුලි බල්බ සවිකර සංවර්ධනය කිරීම සඳහා සභා අරමුදලින් රු. 159,488.00 ක මුදලක් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 11 ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නාවලපිටිය කහමාන ශ්‍රී රංසිමාලකාරාම විහාරස්ථාන පුස්තකාලයේ පොත් රුඳවීම සඳහා පොත් රාක්ක හා මේසයක් ලබා දීම සඳහා සභා අරමුදලින් රු. 99,000.00 ක මුදලක් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 12 ලේකම්, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය, මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම - පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ටෙම්පල්ස්ටෝවත්ත ලකී බෝයිස් ක්‍රීඩා සමාජය සඳහා වොලිබෝල් නෙට් හා ක්‍රිකට් ක්‍රීඩා කරන බැට් හා බෝල ලබා දීම සඳහා සභා අරමුදලින් රු. 19,000.00 ක මුදලක් වියදම් දැරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 13 පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පල්ලේකැලේ, කුණ්ඩසාලේ

වැඩිහිටියන් සඳහා පුස්තකාල පරිහරණ පහසුකම් ලබා දීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 14 ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය පස්බාගේ කෝරළේ - නාවලපිටිය

මැනුම් ඉල්ලීම අංකය - KDS/PBK/4/4/12/2023(567) මාපාකන්ද උතුර සුසාන භූමිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 15 ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය පස්බාගේ කෝරළේ - නාවලපිටිය

මැනුම් ඉල්ලීම අංකය - KDS/PBK/4/4/13/2023(568) වැලිගම්පොල සුසාන භූමිය යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 16 ගරු සභාපතිතුමා, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ 2022.12.31 දිනට ආණ්ඩුවේ ද්‍රව්‍ය පිළිබඳ වාර්ෂික දෙපාර්තමේන්තු සමීක්ෂණ වාර්තාව සභාගත කරන ලදි.

02 - 17 ගරු සභාපතිතුමා, පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව
පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාලයේ 2022.12.31 වන දිනට පොත් පිළිබඳ සමීක්ෂණ වාර්තාව සභාගත කරන ලදි.

02 - 18 අතිරේක මැතිවරණ කොමසාරිස්, මැතිවරණ කොමිෂන් සභාව
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023 රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල මැතිවරණ කාලසීමාව තුළදී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ඡන්ද විමසීම පැවැත්වෙන පළාත්වලට අදාළ නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම / උසස් කිරීම / මාරු කිරීම සීමා කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 19 මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ කොමිෂන් සභාව
චක්‍රලේඛ අංක - 20 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023 රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල මැතිවරණ කාලසීමාව තුළදී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ඡන්ද විමසීම පැවැත්වෙන පළාත්වලට අදාළ නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම / උසස් කිරීම / මාරු කිරීම සීමා කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 20 ප්‍රධාන සහකාර තේරීම්භාර නිලධාරි, මැතිවරණ කාර්යාලය, මහනුවර දිස්ත්‍රික්කය
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023 පළාත් පාලන මැතිවරණ කාල සීමාවේදී ප්‍රාදේශීය සභා අරමුදල් යොදාගෙන සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම යන මැයෙන් වූ ලිපිය සභාගත කරන ලදි.

02 - 21 ගරු සභාපතිතුමා, පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව
පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කර ඇති 2023 වර්ෂය සඳහා වන පුරවැසි ප්‍රඥප්තිය සභාගත කරන ලදි.

**03. මහජන පෙත්සම්, පැමිණිලි හා ලිපි සභාගත කිරීම**
නැත

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**
නැත

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**
05 - 01 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
ප්‍රාග්ධන වත්කම් නඩත්තු සැලැස්ම - 2022 යටතේ ලබා දුන් ප්‍රතිපාදන මත ඉටුකරනු ලැබූ පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීමට අදාලව බිල්පත් 2022.12.01 දින පළාත් පාලන සහකාර කොමසාරස් වෙත යවන ලදි. මුදල් ප්‍රතිපූර්ණය මෙතෙක් සිදු නොවූ බැවින් අවස්ථා කීපයකදී දුරකථනයෙන් විමසුවද ලද පසු ගෙවීම් කරන බව දෙපාර්තමේන්තුව පවසයි. එහෙත් අදාල තීන්ත ලබාදුන් ආයතන නිරතුරුවම ඔවුන්ගේ බිල්පත් නිරවුල් කර දෙන ලෙස ඉල්ලා දුරකථන ඇමතුම් ලබා දෙන බැවින් එම බිල්පත් මුදල වන රු. 398,840.00 ක මුදල සභා අරමුදලින් ගෙවා ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථීර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 02 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
නාගරික සංවර්ධන අධිකාරිය මගින් මගේ අංක 17/01/03/18/01 හා 2023.01.18 දිනැතිව යොමු කරන ලද සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීම - පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව යන මැයෙන් එවා ඇති ලිපියට අනුව ගලබොඩ හා කඩියන්ලෙන දියඇලි ආශ්‍රිත සංචාරක ප්‍රවර්ධන පහසුකම් වැඩිදියුණු කිරීමට අදාලව යෝජිත ව්‍යාපෘති භූමිය ආවරණය වන පරිදි භූමියේ වට මැනුම, සමෝච්ච රේඛා, පවත්නා ගල්පර හා ගස්, ජල මාර්ග හා දියඇලි යන නිර්ණායකයන් ඇතුළත් වන පරිදි මිනින්දෝරු සැලසුම් කඩිනමින් උක්ත අධිකාරිය වෙත ඉල්ලා ඇති බැවින් මිල ගණන් කැඳවා මිනින්දෝරු සැලසුම් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එච්.ජී මෛත්‍රීපාල මහතා
එම යෝජනාව මම ස්ථීර කරමි.

මේ පිළිබද සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.
05 - 03 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2022.12.21 දින පවත්වන ලද අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුවේදී GIS ක්‍රමයට මාර්ග සිතියම් ගත කිරීමට අදාල ඉදිරිපත් කිරීමක් සිදු කර ඇත. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ක්‍රියාත්මක වන දින සිට වසර 03 ක් ඇතුළත ස්වකීය බල ප්‍රදේශයේ මාර්ග ගැසට් නිවේදන මඟින් ප්‍රකාශයට පත් කළ යුතු වුවද එලෙස යාවත්කාලීන වූ මාර්ග ලැයිස්තුවක් සකස් කර නොමැති පළාත් පාලන ආයතන වෙත GIS තාක්ෂණය ඔස්සේ මාර්ග සිතියම් ගත කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගැනීම පිණිස එකඟතාවය ලබා දීම සඳහා සහා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 04 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ මැහුම් පාඨමාලාව එල්. එච්. චාන්දනී වික්‍රමසිරි මියගේ උපදේශකත්වයෙන් නැවත ආරම්භ කිරීමටත්, පාඨමාලා කාලය මාස 06 ක් හා පාඨමාලා දීමනාව එක් වසමකට රු. 10,000.00 වන ලෙස වසම් දෙකක් සඳහා රු. 20,000.00 ක් ලෙසද දෙකිඳ, මාපාකන්ද, ඉඟුරුඔය, පල්ලේගම, වරකාව, ඉඹුල්පිටිය, වැලිගොඩවත්ත යන වසම් සඳහා මේ වන විට පාඨමාලා අවසන් කර ඇති බැවින් බව්වාගම, බලංතොට හා අළුත්ගම වසම් සුදුසු බවත්, මෙකී පාඨමාලාව සඳහා සහතික පත්‍ර මුද්‍රණය හා වයිට් බෝඩ් ඇතුළුව අනිකුත් අවශ්‍ය දේ සභාව මඟින් වෙන්ව ඇති ඉතිරි මුදලින් පියවා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා දිම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 05 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවේ ජල අංශය විසින් පවත්වනු ලබන ජංගම කාර්යාල සඳහා ශබ්ද විකාශන යන්ත්‍රය භාවිතා කර නිවේදනය කරන අතර මේ වන විට සභාවේ පවතින ශබ්ද විකාශන යන්ත්‍ර අක්‍රිය බැවින් නිවේදන කටයුතු කිරීමට නොහැකි තත්වයට පත්ව ඇත. එබැවින් නව ශබ්ද විකාශන යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් වඩාත් හොඳ වර්ගයේ ශබ්ද විකාශන යන්ත්‍රයක් තෝරා මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 06 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
"ඉසුර", කෞදර්ස් ලැන්ඩ්, රඹුක්පිටිය ලිපිනයේ පදිංචි නයිද හේවා පද්මලාල් මහතා පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් නාවලපිටිය ගිනිගත්හේන ප්‍රධාන මාර්ගයේ පිහිටි අංක 3130 දරන පිඹුරු පතෙහි සඳහන් කඩ පේළියෙහි අංක 13 කඩකාමරය බඳු පදනම මත ලබා ගෙන ඇත. දැනට ඔහු අසනීප තත්වයෙන් පසුවන බැවින් නයිද හේවා පද්මලාල් මහතාගේ ඉල්ලීම පරිදි ඉහත කඩ කාමරයෙහි බඳු බලපත්‍රයේ අයිතිය ඔහුගේ දියණිය වන සචිත්‍රා සුකුමාලි නයිදහේවා යන අය වෙත පවරා දීම සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 07 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2023.03.08 වන දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දින සැමරුමට සමගාමීව රඹුක්පිටිය මහජන පුස්තකාලය මඟින් මාපාකන්ද දැහැමි ජංගම පුස්තකාලයේ පාඨකයින් හා පෙරපාසල් දරු දැරියන්ගේ මවුවරුන් සඳහා "සූපශාස්ත්‍ර වැඩසටහනක්" සංවිධානය කරන බැවින් ඒ සඳහා යන රු. 10,000.00 ක වියදම් ඇස්තමේන්තුව සඳහා සහා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

| අනු අංකය | අයිතමය | මුදල |
|---|---|---|
| 01 | අමුද්‍රව්‍ය සඳහා වියදම | 3,000.00 |
| 02 | සංග්‍රහ | 5,000.00 |
| 03 | සම්පත් දායක දීමනාව | 2,000.00 |

| | |
|---|---|
| එකතුව | 10,000.00 |

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 –08 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාවට අයත් අංක ZA 5171 දරණ JCB යන්ත්‍රය කළු දුම දැමීම හා ධාවනය නොවීම නිසා එය අලුත්වැඩියා කර දෙන ලෙස JCB යන්ත්‍ර ක්‍රියාකරු විසින් කරන ලද ඉල්ලීමට අනුව එහි අලුත්වැඩියාවන් සම්බන්ධව ලංකා ගමනාගමන මණ්ඩලයේ (CTB) ඉංජිනේරුතුමාගේ වාර්තාව අනුව පිස්ටන් 04, සිලිව් 04, මේන් බෙයාරින්, ක්‍රෑන්ක් රොඩ් බෙයාරින්, කැම් බුෂ් 04, වැල් 08, වැල් ගයිඩ් 08, සැලැක් 02, සලාස්ටික් 02, රින්ග් (St 01), ෆෑන් බෙල්ට් 01, බෙල්ට් සජෙස්ටර් 01, කිකර් පොම්ප් 01, රීබෝරින් කිරීම, ඩීසල් පොම්ප් රෙපයාර්, නොසොල් 04, එන්ජින් ඔයිල් ලීටර 10, ඔයිල් ෆිල්ටර් 01, ඩීසල් ෆිල්ටර් 03, ජැක් සීල් කිට් 04, ට්‍රාන්ස්මිෂන් ඔයිල් ෆිල්ටර් 01, SAE 30 ඔයිල් ලීටර් 10, කන්වෙන්ටර් ඔයිල් සීල් 01, එයාර් ෆිල්ටර් 01, රේඩියේටර් අලුත්වැඩියා කිරීම, ඉන්ටර්කූලර් අලුත්වැඩියා කිරීම, ඩීසල් ටැංකිය පිරිසිදු කිරීම, හයිඩ්‍රොලික් ඔයිල් ලීටර 10, ගැස්කට් ඩිරෝල් කිට් යන උපාංග යොදා අලුත්වැඩියා කිරීමට මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී වී මුරලිදරන් මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 09 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
31 ශ්‍රී 9698 ජීප් රථයේ බඳ සැකිල්ල අබලන් තත්වයේ පවතින බැවින් එය අලුත්වැඩියා කර දෙන ලෙස රියදුරු ආර්. ඉලංගෝවන් විසින් කරන ලද ඉල්ලීමට අනුව එහි අලුත්වැඩියාවන් සම්බන්ධව ලංකා ගමනාගමන මණ්ඩලයේ (CTB) ඉංජිනේරුතුමාගේ වාර්තාව අනුව සම්පූර්ණ බොඩි අලුත්වැඩියාව, බට කූඩුව අලුතින් සකස් කර ටෙන්ට් ගැසීම, ආසන අලුත්වැඩියාවන් යන කාර්යයන් කිරීමට මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.එල්.අරුණ ශාන්ත මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 –10 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2014 වසරේ එක ගමකට එක වැඩක් යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරන ලද මැදගහවතුර ප්‍රජා ශාලාව සංවර්ධනය කිරීම හා ගොඩැල්ල පාර කොන්ක්‍රීට් කිරීම යන ව්‍යාපෘතීන්හි පැවති අඩුපාඩු නියමිත කාලසීමාව තුළ සම්පූර්ණ කර නොමැතිවීම හේතුවෙන් එකී ව්‍යාපෘතීන්ට අදාල රඳවුම් මුදල් වසර දෙක ඉක්ම වූ පොදු තැන්පතු රජයේ ආදායමට බැර කිරීම යටතේ රජයේ ආදායමට බැර කර ඇති බවද, 2014 පුර නැඟුම යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරන ලද බලංතොට උතුර ප්‍රජා ශාලාව ඉදිකිරීම යන ව්‍යාපෘතිය ඉඩමේ ගැටළුවක් හේතුවෙන් හා ඉටු නොකර අත්හැර දැමු ව්‍යාපෘතියක් වීම හේතුවෙන් මුදල් ගෙවීම නොකළ බවද පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇත. එබැවින් එම ව්‍යාපෘතීන්ට අදාල බිල්පත් මුදල් සභා ගිණුම්වලින් කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. මැදගහවතුර ප්‍රජා ශාලාව සංවර්ධනය කිරීම - රු. 10,011.80
2. ගොඩැල්ල පාර කොන්ක්‍රීට් කිරීම - රු. 49,000.00
3. බලංතොට උතුර ප්‍රජා ශාලාව ඉදිකිරීම - රු. 1,470,000.00

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
බලංතොට ප්‍රජා ශාලාව මාර්ග සංවර්ධන අධිකාරිය තාම සභාවට පවරලා නැහැ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා

2014 හැදුවට පස්සේ බාගෙට වැඩ කරලා දෙසැම්බර් 31 වෙද්දි ඉවර කරන්න බැරි වුණා. ඊළඟ අවුරුද්දට ගන්න ගියාට පස්සේ ඉඩම්වල ආරවුල නිරාකරණය කර ගන්න තෙක් වැඩ නැවතුණා. සල්ලි ටික ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තියන් හිටියා අවුරුදු 02 ක්. විගණන ප්‍රශ්න එනවා ඒ ආයතනයටත් රඳවාගෙන ඉන්නවා කියලා.

ගරු උප සභාපති එච්.ඒ නන්දසෝම මහතා
අපේ ඉල්ලීමට එකඟවෙලා කොන්ත්‍රාත්කරු ලක්ෂ 15 ක් වියදම් කරලා ඒ ගොඩනැඟිල්ල හදලා තියෙන්නේ. අවුරුදු 08 ක් ඒ ගොඩනැඟිල්ලට සල්ලි ගෙව්වේ නෑ. මම කීප වතාවක් මහා මාර්ග අමාත්‍යාංශයට ගිහිල්ලා මැනුම් කරලා ප්‍රාදේශීය සභාවට පවරලා දෙන්න කටයුතු ලියකියවිලි හදාගෙන යනවා. තවම ඒ කටයුතු සිද්ධ වුනේ නෑ.

ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
කවදාහරි දවසක පවරගත්ත දවසක කොටස් වශයෙන් හරි සභාවෙන් සල්ලි ගෙවන්න තමා වෙන්නේ. ගොඩනැඟිල්ලේ අයිතිය හරි ලැබිලා තිබ්බානම් කොටස් වශයෙන් හරි ගෙවන්න තිබ්බා. ඉදිරියේදී සභාවට ගොඩනැඟිල්ලේ අයිතිය හරි ලැබුනොත් සභාවෙන් හරි ගෙවන්න කටයුතු කරමු.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 11 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
අලුත්ගම ඉසදීන් ජනපදයේ ජල යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීම විමධ්‍යගත අයවැය - 2018 කරුණ යටතේ පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇති පරිදි උක්ත ව්‍යාපෘතිය ඉදි කිරීමෙන් පසුව අදාළ ප්‍රතිලාභීන් හට එම ව්‍යාපෘතිය මඟින් ජලය නොලැබීම හේතුවෙන්, ව්‍යාපෘතියේ මූලික අරමුණු ඉටු නොවීම මත හා අඩු පාඩු සකස් නොකිරීම හේතුවෙන් රුඳවුම් කාලය ඉක්ම වූ පසු එම මුවල මේ වන රාජ්‍ය ආදායමට බැර කර ඇති බව දන්වා එවා ඇත. එබැවින් එම ව්‍යාපෘතීන්ට අදාල බිල්පත් මුදල වන රු. 19,385.82 ක මුදල සභා ගිණුම්වලින් කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී මහින්ද ගුණසේකර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 12 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
නාවලපිටිය දිසා අධිකරණයේ නඩු අංකය - 84758 දරන නඩුව සඳහා 2022.12.22 දින පෙනී සිටීමේ සහ එදිනට ප්‍රකාශයට පත් කළ නියෝගයට අදාල ලිඛිත දේශන සූදානම් කිරීමේ ගාස්තු වෙනුවෙන් රු. 15,000.00 ක මුදලක් නීතිඥ නයනානන්ද අලුත්ගමගේ මහතා විසින් කරන ලද ඉල්ලීමට අනුව උක්ත මුදල ගෙවීමටත් මෙම නඩුව අවසන් වන තෙක් එක් නඩු වාරයක් සඳහා පෙනී සිටීම වෙනුවෙන් රු. 15,000.00 ක මුදලක් බැගින් එම නීතිඥ මහතා වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 13 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
නිදහස් දිනයට සමගාමීව ආදර්ශ ගෙවතු ආරම්භ කිරීමට අදාලව දෙකිඳ ග්‍රාම නිලධාරි වසමේ ආදර්ශ ගෙවතු 10 ස්ථාපිත කිරීමට අදාලව ගෙවතු වගා සිදු කරන පවුල් 10 ක් තෝරා ගෙන ඔවුන්ගේ ගෙවතු සඳහා තවාන් පැල, බීජ කට්ටල, ඖෂධ පැල, පලතුරු පැල කිහිපයක් ඇතුළත්ව බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා වන වැඩසටහන සඳහා රු. 20,000.00 ක ප්‍රතිපාදන මුදලක් වෙන් කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 14 ගරු මන්ත්‍රී එච්.ඒ.එන්.සී රණසිංහ මහතා
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් පල්ලේගම පන්සලට ඉහළින් යන දන්ගහදෙණිය මාර්ගය සංවර්ධනය සඳහා රු. 100,000.00 ක ප්‍රිතිපාදන වෙන් කිරීම යන යෝජනාව සංශෝධනය කර පල්ලේගම ශ්‍රී නන්දරාම විහාරස්ථානය අලුත්වැඩියා කිරීම ලෙස සංශෝධනය කර එම යෝජනාව සඳහා රු.100,000.00 ක ප්‍රතිපාදන වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.
ගරු මන්ත්‍රී එම්.ජී.ඩබ්.කේ.එස් මැණිකේ මිය
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 15 ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා සමිති සඳහා ක්‍රීඩා භාණ්ඩ ලබා දීම සඳහා රු. 75,000.00 වෙන් කිරීම හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ගොවි සමිති සඳහා උදලු තල ලබා දීම සඳහා රු. 75,000.00 වෙන් කිරීම යන යෝජනා දෙක සංශෝධනය කර බලංතොට ශ්‍රී බෝධිරුක්ඛාරාම විහාරස්ථානයේ බුදු මැදුරේ වහලය පිළිසකර කිරීම සඳහා උක්ත රු. 150,000.00 ක මුදල වෙන් කිරීම සුදුසු පවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 16 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් හයිඩ්‍රි බෝධිරාජ විහාරස්ථානයට යකඩ කබඩ් 02 ක් ලබා දිමට රු. 50,000.00 වෙන් කිරීම යන යෝජනාව සංශෝධනය කර එම මුදල පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. හයිඩ්‍රි එකමුතු ක්‍රීඩා සමාජයට ක්‍රීඩා භාණ්ඩ ලබා දීම සඳහා - රු. 30,000.00
2. බාර්කේපල්වත්ත මැද කොටස උදයන් ක්‍රීඩා සමාජයට ක්‍රීඩා භාණ්ඩ ලබා දීම සඳහා - රු. 20,000.00

ගරු මන්ත්‍රී එස්.එල්.අරුණ ශාන්ත මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 17 ගරු මන්ත්‍රී පූජ්‍ය නමඩගස්වැව සුගතසෝම හිමි
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් බාර්කේපල්වත්ත සිට නාවලපිටිය මාර්ගයේ ග්ලිස්ටන් කොටසේ අබලන්ව ඇති මාර්ගය සංවර්ධනය සඳහා රු. 100,000.00 වෙන් කිරීම යෝජනාව සංශෝධනය කර හයිඩ්‍රිවත්ත ශ්‍රී බෝධිරාජ විහාරස්ථානයේ ආගමික කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන හේවිසි භාණ්ඩ වන ගැටබෙර, තම්මැට්ටම් හා බෙර ලබා ගැනිම සඳහා එම රු. 100,000.00 ක මුදල වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ශාන්තලාල් පෙරේරා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 18 ගරු මන්ත්‍රී වී. මුරලිදරන් මහතා
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 100,000.00 ක මුදල කඩියන්ලෙන සිට බාර්කේපල් දක්වා පාර ප්‍රිමික්ස් කිරීම යන යෝජනාව සංශෝධනය කර එම රු. 100,000.00 ක මුදල වීථි ලාම්පු ලබා ගැනිම සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 19 ගරු මන්ත්‍රී වී. මුරලිදරන් මහතා
2023 වර්ෂයේ මාගේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු. 50,000.00 ක් කේ. එම්. ජී. සුජීව මහතාගේ දියණිය වන කේ. එම්. ජී. දිල්රුක්ෂි දියණියට ගැට බෙරයක් හා තම්මැට්ටමක් ලබා දීම යන යෝජනාව සංශෝධනය කර එම රු. 50,000.00 ක මුදල බාර්කේපල් උඩ කොටස මුත්තුමාරි අම්මාන් කෝවිලට යන පාරට අඩි 8 බෝක්කු බට, අඩි 4 බෝක්කු බට හා ඉතිරි මුදලට සිමෙන්ති ග්ලිස්ටන් ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලබා දීම සඳහා වෙන් කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.
ගරු මන්ත්‍රී ජී.එස්.ඒ ෆොන්සේකා මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 – 20 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව වෙත ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී ඒ.ජී.ටී.ඒ සිරිසේන මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා මිල ගණන් කැඳවා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 21 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022 වසරේ 31 – 9698 ජීප් රථය අලුත්වැඩියා කිරීම සඳහා 404 – 1 වැය ශීර්ෂය මඟින් රු. 687,010.00 ක මුදලක් ණය හිමි කර වෙන් කර ඇත. නමුත් ජීප් රථය අලුත්වැඩියා කිරීම සඳහා රු. 489,490.00 ක මුදලක් වියදම් විය. ඉතිරි මුදල වන රු. 197,520.00 ක මුදලක් ණය හිමි ලේඛනයේ ඉතිරිව ඇති බැවින් එම මුදල කපා හැරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

ගරු මන්ත්‍රී එම්.එල්.සී.ආර් මොල්ලිගොඩ මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

05 - 22 ගරු සභාපති ඕ.ජී රෝහණ බණ්ඩාර මහතා
2022 භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව මෙම සභාවේ අපහරණය කළ යුතු භාණ්ඩ පිළිබඳ ඉදිරි කටයුතු සිදු කිරීමට (අපහරණ භාණ්ඩ තක්සේරුව ඇතුළුව) පහත නිලධාරීන්ගෙන් සැදුම්ලත් අපහරණ මණ්ඩලය පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට මම යෝජනා කරමි.

1. සුදර්ශනී කුමාරි මිය (කළමනාකරණ සේවා නිලධාරි) - අපහරණ මණ්ඩලයේ සභාපති
2. සම්පත් ගුණසේකර මයා (තාක්ෂණ නිලධාරි) - සාමාජික
3. දිල්රුක් දිසානායක මයා (පරිසර නිලධාරි) - සාමාජික
4. ඩී. පී. එන්. පල්ලියගුරු මයා (ආදායම් පරීක්ෂක) - සාමාජික
5. යමුනා ප්‍රියදර්ශනී මිය (සංවර්ධන නිලධාරි - අභ්‍යන්තර විගණන ) - සාමාජික

ගරු මන්ත්‍රී එස්.ඒ.ටී පුෂ්පකුමාර මහතා
එම යෝජනාව මම ස්ථිර කරමි.

මේ පිළිබඳ සලකා බැලූ මහා සභාව උක්ත යෝජනාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

06. **කාරක සභා වාර්තා සභා සම්මත කිරීම**

| | | |
|---|---|---|
| 06 - 01 මුදල් කාරක සභාව | - | 2023.02.13 |
| 06 – 02 පරිසර හා පහසුකම් කමිටුව | - | 2023.02.09 |
| 06 – 03 ගැටුම් සමථකරණ කාරක සභාව | - | 2023.02.14 |
| 06 – 04 නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව | - | 2023.02.14 |

07. **බැංකු සැසඳුම් ප්‍රකාශය, අභ්‍යන්තර විගණන වාර්තාව, ලැබීම් සාරාංශය, ගෙවීම් සාරාංශය, ගෙවීම් වාර්තාව, පුස්තකාල ප්‍රගතිය, සංවර්ධන ප්‍රගතිය ඉදිරිපත් කිරීම**

- 2023.01.01 දින සිට 2023.01.31 දක්වා වවුචර් අංක 01 සිට 137 දක්වා ගෙවීම් වවුචර් සභාගත කරන ලදී.

- බැංකු සැසඳුම් ප්‍රකාශය

**බැංකු සැසඳුම් ප්‍රකාශනය - 2022 දෙසැම්බර්**

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

ගිණුම් අංකය :- 053-1-001-6-4889286
මාසය :-2022 දෙසැම්බර්

| | | | | |
|---|---|---|---|---|
| 2022.12.01 දිනට මුදල් පොතේ ශේෂය | රු. | 9,371,456.82 | | |
| එකතු කළා :- දෙසැම්බර් මස මුළු ලැබීම් | රු. | 22,012,691.82 | | |
| අඩු කළා :- දෙසැම්බර් මස මුළු ගෙවීම් | රු. | 25,798,382.65 | | |
| 2022.12.01 දිනට මුදල් පොතේ ශේෂය | | | රු. | 5,585,765.99 |

| | | | |
|---|---|---|---|
| <u>එකතු කළා</u> | | | |
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් (උ:ලේ 01) | රු. | 2,766,635.39 | |
| සෘජු ප්‍රේෂණ (උ:ලේ 04) | රු. | | |
| බැංකුව විසින් අඩුවෙන් ගෙවා ඇති මුදල (උ:ලේ 05) | රු. | 0.35 | 2,766,635.74 |
| | | | 8,352,401.73 |

| | | | | |
|---|---|---|---|---|
| <u>අඩු කළා</u> | | | | |
| අත ඉතිරි මුදල් හා චෙක්පත් (උ:ලේ 02) | රු. | 48,068.00 | | |
| බැංකු ගාස්තු (උ:ලේ 03) | රු. | 117.94 | | |
| නිෂ්කාෂනය නොවූ චෙක්පත් (උ:ලේ 04) | රු. | 6,500.00 | | |
| | | | රු. | 54,685.94 |
| 2022.12.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | | | 8,297,715.79 |

- 2022 දෙසැම්බර් මස ගෙවීම් සාරාංශය

**<u>පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව</u>**

**<u>මාසික ඒකාබද්ධ වැය සාරාංශය - 2022 දෙසැම්බර් මාසය</u>**

| අය විෂය නාමයන් | එකතුව | මුළු එකතුව |
|---|---|---|
| 01. වැටුප් හා දීමනා | 3,275,537.70 | |
| 02. ගමන් වියදම් | 68,999.98 | |
| 03. සැලසුම් හා උපකරණ | 2,500,951.67 | |
| 04. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 1,073,245.00 | |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 1,226,238.85 | |
| 06.පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 80,997.36 | |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 136,620.31 | |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතොෂිත | 10,228.32 | |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | | **8,372,819.19** |
| ප්‍රාග්ධන වියදම් | | |
| 09.ප්‍රාග්ධන වැය | | 16,775,336.93 |
| 10. ණය ආපසු ගෙවීම් | | 200,485.62 |
| **ප්‍රාග්ධන වැය එකතුව** | | 16,975,822.55 |
| **පුනරාවර්ථන වැය හාප්‍රාග්ධන වැය මුළු එකතුව** | | **25,348,641.74** |
| විවිධ ණය හිමියන් | 201,000.00 | |
| කර්.ණයහිමියන් (309-3-I) | 349,053.19 | |
| කර්.ණයහිමියන් (309-3-III) | 155,613.69 | |
| කර්.ණයහිමියන් (304-5) | - | |
| 10% කර්මාන්ත තැන්පත් | 179,072.00 | |
| විවිධ තැන්පත් | 773,387.60 | |
| මුද්දර තැන්පත් | 12,625.00 | |
| දේපල ණය පොළී | 10,600.37 | |

| | | |
|---|---|---|
| සේවක ණය | 231,863.00 | |
| අත්තිකාරම් | 464,950.00 | |
| සමුච්චිත අරමුදල | | |
| ලිපිද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | 252,430.10 | |
| ජල ගබඩා අත්තිකාරම් | 274,110.00 | |
| අහරු චෙක්පත් | | |
| කර්.ණයගැතියන් | | |
| **එකතුව** | | **2,904,704.95** |
| **2022/12/31 දක්වා මුළු ගෙවීම් වල එකතුව** | | **28,253,346.69** |

- 2022 දෙසැම්බර් මස ලැබීම් සාරාංශය

පස්බාගේකෝරළේ ප්‍රාදේශීය සභාව

**2022 දෙසැම්බර් මාසය සඳහා ඒකාබද්ධ ලැබීම් සාරාංශය**

| අය විෂයන් | මුළු එකතුව | |
|---|---|---|
| | රු.ශත | |
| 10 වරිපනම් හා බදු | 296,084.66 | |
| 20 කුලී | 298,075.80 | |
| 30 බලපත්‍ර ගාස්තු | 36,150.00 | |
| 40 සේවා සදහා ගාස්තු | 344,056.50 | |
| 50 වරෙන්තු ගාස්තු | 356,035.53 | |
| 60 වෙනත් ආදායම් | 554,058.14 | |
| 70 වෙනත් ආධාර | 3,061,260.80 | |
| පුනරාවර්ථන ආදායම් එකතුව | | **4,945,721.43** |
| ප්‍රාග්ධන ආදායම | - | |
| 80 මූලධන ලැබීම් | | |
| එකතුව | | |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් වල මුළු එකතුව | | **4,945,721.43** |
| **වෙනත් ලැබීම්** | | |
| ජල ණය ගැතියෝ | 4,498.00 | |
| ජල තැන්පත් | 5,000.00 | |
| මුද්දර | 2,925.00 | |
| විවිධ තැන්පත් | 630,706.41 | |
| සේවක ණය | 183,395.48 | |
| කර්මාන්ත තැන්පත් | | |
| දේපල ණය | 10,600.37 | |
| විවිධ ණය ගැතියෝ | | |
| අත්තිකාරම් පියවීම | 910,888.00 | |
| ජල ගබඩා අත්තිකාරම් පියවීම | 464,935.27 | |
| රු 25 මුද්දර | 1,600.00 | |
| කර්මාන්ත ණය ගැතියෝ | 16,520,770.12 | |
| වෙනත් ලැබීම් | 786,665.78 | |
| වෙනත් ලැබීම් වල එකතුව | | **19,521,984.43** |
| 2022/12/31 දක්වා මුළු ලැබීම් එකතුව | | **24,467,705.86** |

- බැංකු සැසඳුම් ප්‍රකාශය

**බැංකු සැසඳුම් ප්‍රකාශනය - 2023 ජනවාරි**

පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව

ගිණුම් අංකය :- 053-1-001-6-4889286
මාසය :-2023 ජනවාරි

| | | | | |
|---|---|---|---|---|
| 2023.01.01 දිනට මුදල් පොතේ ශේෂය | රු. | 5,585,765.99 | | |
| එකතු කළා :- ජනවාරි මස මුළු ලැබීම් | රු. | 21,283,680.18 | | |
| අඩු කළා :- ජනවාරි මස මුළු ගෙවීම් | රු. | 11,162,492.24 | | |
| 2023.01.01 දිනට මුදල් පොතේ ශේෂය | | | රු. | 15,706,953.93 |

<u>එකතු කළා</u>

| | | | | |
|---|---|---|---|---|
| නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් (උ:ලේ 01) | රු. | 440,126.84 | | |
| බැංකුව විසින් අඩුවෙන් ගෙවා ඇති මුදල (උ:ලේ 05) | රු. | 0.35 | | 440,127.19 |
| | | | | 16,147,081.12 |

<u>අඩු කළා</u>

| | | | | |
|---|---|---|---|---|
| අත ඉතිරි මුදල් හා චෙක්පත් (උ:ලේ 02) | රු. | 274,501.43 | | |
| බැංකු ගාස්තු (උ:ලේ 03) | රු. | 117.94 | | |
| නිෂ්කාෂනය නොවූ චෙක්පත් (උ:ලේ 04) | රු. | 11,739.85 | | |
| | | | රු. | 286,359.22 |
| 2023.01.31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය | | | | 15,860,721.90 |

- 2023 ජනවාරි මස ගෙවීම් සාරාංශය

**<u>පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව</u>**

**<u>මාසික ඒකාබද්ධ වැය සාරාංශය - 2023 ජනවාරි මාසය</u>**

| අය විෂය නාමයන් | එකතුව | මුළු එකතුව |
|---|---|---|
| 01. වැටුප් හා දීමනා | 3,018,944.58 | |
| 02. ගමන් වියදම් | 630.00 | |
| 03. සැලසුම් හා උපකරණ | 553,031.00 | |
| 04. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 11,325.00 | |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 71,982.66 | |
| 06.පොලී ගෙවීම් ලාභාංශය හා ප්‍රසාද මුදල් | 31,951.17 | |
| 07. ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 5,400.00 | |
| 08. විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | - | |
| **පුනරාවර්ථන වියදම් එකතුව** | | **3,693,264.41** |
| ප්‍රාග්ධන වියදම් | | |
| 09.ප්‍රාග්ධන වැය | - | |
| 10. ණය ආපසු ගෙවීම් | 249,531.81 | |
| **ප්‍රාග්ධන වැය එකතුව** | | 249,531.81 |
| **පුනරාවර්ථන වැය හාප්‍රාග්ධන වැය මුළු එකතුව** | | **3,942,796.22** |
| විවිධ ණය හිමියන් | 898,933.63 | |
| කර්.ණයහිමියන් (309-3-I) | - | |
| කර්.ණයහිමියන් (309-3-III) | 6,216,182.97 | |
| කර්.ණයහිමියන් (304-5) | 149,681.36 | |
| 10% කර්මාන්ත තැන්පත් | 14,550.51 | |
| විවිධ තැන්පත් | 6,900.19 | |
| මුද්දර තැන්පත් | - | |
| දේපල ණය පොළී | 10,496.49 | |
| සේවක ණය | 140,000.00 | |

| | | |
|---|---|---|
| අත්තිකාරම් | 5,000.00 | |
| සමුච්චිත අරමුදල | - | |
| ලිපිද්‍රව්‍ය ගබඩා අත්තිකාරම් | - | |
| ජල ගබඩා අත්තිකාරම් | 6,813.00 | |
| අහරු චෙක්පත් | - | |
| කර්.ණයගැතියන් | - | |
| **එකතුව** | | 7,448,558.15 |
| **2023/01/31 දක්වා මුළු ගෙවීම් වල එකතුව** | | 11,391,354.37 |

- 2023 ජනවාරි මස ලැබීම් සාරාංශය

පස්බාගේකෝරලේ ප්‍රාදේශීය සභාව

**2023 ජනවාරි මාසය සඳහා ඒකාබද්ධ ලැබීම් සාරාංශය**

| අය විෂයන් | මුළු එකතුව | |
|---|---|---|
| | රු.ශත | |
| 10 වරිපනම් හා බදු | 449,064.83 | |
| 20 කුලී | 176,852.14 | |
| 30 බලපත්‍ර ගාස්තු | 164,900.00 | |
| 40 සේවා සදහා ගාස්තු | 933,003.00 | |
| 50 වරෙන්තු ගාස්තු | 28,293.33 | |
| 60 වෙනත් ආදායම් | 10,194,583.62 | |
| 70 වෙනත් ආධාර | 2,981,269.58 | |
| පුනරාවර්ථන ආදායම් එකතුව | | **14,927,966.50** |
| ප්‍රාග්ධන ආදායම | - | |
| 80 මූලධන ලැබීම් | - | |
| එකතුව | | - |
| පුනරාවර්ථන හා ප්‍රාග්ධන ආදායම් වල මුළු එකතුව | | **14,927,966.50** |
| **වෙනත් ලැබීම්** | | |
| ජල ණය ගැතියෝ | - | |
| ජල තැන්පත් | 1,000.00 | |
| මුද්දර | 16,150.00 | |
| විවිධ තැන්පත් | 188,069.20 | |
| සේවක ණය | 136,208.95 | |
| කර්මාන්ත තැන්පත් | 14,968.13 | |
| දේපල ණය | 10,496.49 | |
| විවිධ ණය ගැතියෝ | - | |
| අත්තිකාරම් පියවීම | - | |
| ජල ගබඩා අත්තිකාරම් පියවීම | - | |
| රු 25 මුද්දර | 1,500.00 | |
| කර්මාන්ත ණය ගැතියෝ | 6,216,182.97 | |
| වෙනත් ලැබීම් | - | |
| වෙනත් ලැබීම් වල එකතුව | | **6,584,575.74** |
| 2023/01/31 දක්වා මුළු ලැබීම් එකතුව | | **21,512,542.24** |

**08.<u>ටෙන්ඩර් මණ්ඩලය</u>**

08 – 01 ගබඩාවට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| No | Description | Sri Lanka Stores, No. 31, Kothmale rd, Nawalapitiya | | L.H. Chandrasekara & Brothers (Pvt) Ltd, No. 80, Kings street, Kandy | | Lanka Offset Printers, 223, D.S. Senanayaka street,Kandy |
|---|---|---|---|---|---|---|
| | | Brand | Amount | Brand | With VAT | Amount |
| 1 | A4 Photocopy | JK80 | 1,950.00 | Double A | 1,890.00 | 2,122.50 |
| 2 | Blue pen | | 17.90 | | 18.01 | 22.00 |
| 3 | Black pen | | 17.90 | | 18.01 | 22.00 |
| 4 | Red pen | | 17.90 | | 18.01 | 22.00 |
| 5 | Box File | Rexon/Apex | 617.50/297.50 | Panthor 3" | 485.00 | |
| 6 | CR Book (Small) | 80p/40p | 156.00/113.10 | 40pg | 110.40 | |
| 7 | CR Book (Large) | 120p/160p/200p | 234.00/ 319.80/397.80 | 200pg | 453.01 | |
| 8 | Carbon papers (Single side) | | 1,450.00 | Universal 100pkt | 1,695.01 | |
| 9 | Cellotape 1" | | 44.50 | 100m | 173.41 | |
| 10 | Cellotape 2" | | 74.50 | 100m | 335.01 | |
| 11 | Clips | | 67.50 | | 95.40 | |
| 12 | Dot pin | | 67.50 | | | |
| 13 | Computer sheet | 9 1/2 x 11 01ply/02ply | 5538.00/ 14774.00 | 9 1/2 x11 1ply | 5,595.97 | |
| 14 | Double tape 1" | | 119.50 | | 95.40 | |
| 15 | Double tape 2" | | 282.50 | | 218.41 | |
| 16 | Envelope 12x10 | | 14.00 | Manila | 13.80 | 19.00 |
| 17 | Envelope 10x7 | | 6.90 | Manila | 8.05 | 7.50 |
| 18 | Envelope 9x4 | | 4.10 | Manila | 4.28 | 7.50 |
| 19 | Envelope 6x3 | | 2.10 | Manila | 2.19 | 10.00 |
| 20 | Eraser | | 16.00 | Atlas | 19.31 | 18.00 |
| 21 | Field Note Book | | 157.50 | 80pg | 140.00 | 72.00 |
| 22 | File Cover | | 16.00 | Nalaka | 13.01 | |
| 23 | File Lase | | 375.00 | 24" | 295.01 | |
| 24 | Glue | 350ml/750ml/50ml | 167.50/ 267.50/47.50 | | 296.80 | |
| 25 | Highligter pen | | 127.50 | | 125.01 | |
| 26 | Ink Bottle | Lancer | 277.50 | Topseal small | 132.50 | |
| 27 | Laminating Cover | 1 Nos | 29.50 | A4 | 2,585.00 | |
| 28 | Edmand File | No1 | 167.50 | 4 Hole | 115.00 | |
| 29 | Pencil | | 22.50 | Atlas | 30.84 | 432.00 |
| 30 | Foot Ruler | | 33.50 | 12" Natraj | 44.01 | 75.00 |
| 31 | Stapler pin | | 47.50 | Greatwall | 75.00 | |
| 32 | Tipex | | 112.50 | Atlas | 138.81 | |
| 33 | Typing Sheet | | 1,497.50 | LHC | 1,375.01 | |
| 34 | Sticky note | | 102.50 | | 132.50 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 35 | GT53 Black ink | | 3,575.00 | | 3,800.00 | |
| 36 | GT52 Colour ink | CYAN | 3,375.00 | | 3,800.00 | |
| 37 | | YELLOW | 3,375.00 | | 3,800.00 | |
| 38 | | MAGENTA | 3,375.00 | | 3,800.00 | |
| 39 | NPG 59 Toner | | 14,250.00 | Canon | 26,550.00 | |
| 40 | Printer Epson T774 | | 4,375.00 | M100Black | 4,900.00 | |
| 41 | Hand Wash | | 340.00/575.00 | | | |
| 42 | Soap | | 170.00 | | | |
| 43 | Polythin 1 yard | | 22.50 | | | |

| No | Description | New General Trading, No.06, Kumara Veediya, Kandy | | Central Stationeries, 31, Kotugodella Veediya, Kandy | |
|---|---|---|---|---|---|
| | | Brand | Amount | Brand | Amount |
| 1 | A4 Photocopy | Indunisiya/Double A | 1599.00/ 1925.00 | Fuji 80gsm | 1,750.00 |
| 2 | Blue pen | | 19.00 | | 17.90 |
| 3 | Black pen | | 19.00 | | 17.90 |
| 4 | Red pen | | 19.00 | | 17.90 |
| 5 | Box File | Panthor | 471.00 | | 480.00 |
| 6 | CR Book (Small) | | | 40pg | 108.75 |
| 7 | CR Book (Large) | | | 200pg | 446.25 |
| 8 | Carbon papers (Single side) | Universal | 1,650.00 | Universal | 1,550.00 |
| 9 | Cellotape 1" | 25m | 38.08 | 25m/80m | 43.75/145.00 |
| 10 | Cellotape 2" | 25m | 75.04 | 25m/80m | 85.00/290.00 |
| 11 | Clips | | 56.93 | | 65.00 |
| 12 | Dot pin | | | | 37.50 |
| 13 | Computer sheet | | | 9 1/2 x11 1ply | 6,400.00 |
| 14 | Double tape 1" | | 100.80 | | 120.00 |
| 15 | Double tape 2" | | 246.40 | | 240.00 |
| 16 | Envelope 12x10 | 50pcs | 616.00 | Manila | 12.25 |
| 17 | Envelope 10x7 | 50pcs | 392.00 | Manila | 6.90 |
| 18 | Envelope 9x4 | 50pcs | 191.00 | Manila | 4.10 |
| 19 | Envelope 6x3 | 50pcs | 90.00 | Manila | 2.20 |
| 20 | Eraser | | 21.00 | HB | 11.00 |
| 21 | Field Note Book | | 120.00 | | 175.00 |
| 22 | File Cover | | 13.75 | | 15.50 |
| 23 | File Lase | | 380.00 | | 325.00 |
| 24 | Glue | | 271.04 | 50ml | 47.50 |
| 25 | Highligter pen | | 100.80 | | 135.00 |
| 26 | Ink Bottle | | 253.00 | | 125.00 |
| 27 | Laminating Cover | | 22.00 | A4 1Nos | 23.50 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 28 | Edmand File | | 165.00 | 4 Hole | 85.00 |
| 29 | Pencil | | 22.00 | HB | 24.00 |
| 30 | Foot Ruler | | 33.60 | | 35.00 |
| 31 | Stapler pin | | 53.00 | | 62.50 |
| 32 | Tipex | | 123.20 | | 95.00 |
| 33 | Typing Sheet | | 1,340.00 | | 1,425.00 |
| 34 | Sticky note | | 106.40 | | 90.00 |
| 35 | GT53 Black ink | | 2,950.00 | | 2,750.00 |
| 36 | | | 2,450.00 | | 2,750.00 |
| 37 | GT52 Colour ink | | 2,450.00 | | 2,750.00 |
| 38 | | | 2,450.00 | | 2,750.00 |
| 39 | NPG 59 Toner | | 12,450.00 | | 15,000.00 |
| 40 | Printer Epson T774 | | 4,450.00 | | 3,150.00 |
| 41 | Hand Wash | | | 500ml | 210.00 |
| 42 | Soap | | | | |
| 43 | Polythin 1 yard | 1kg | 990.00 | 3m | 90.00 |

| No | Description | Paperline Trading (Pvt) Ltd, No.14, Cross street, Kandy | | | Supercom Trading (Pvt) Ltd, No.115/6, D.S.Senanayaka Veediya, Kandy | |
|---|---|---|---|---|---|---|
| | | Brand | Amount | With VAT | Brand | Amount |
| 1 | A4 Photocopy | JK80GSm | 1,650.00 | 1,897.50 | Double A | 2,150.00 |
| 2 | Blue pen | | 15.52 | 17.85 | | 25.00 |
| 3 | Black pen | | 15.52 | 17.85 | | 25.00 |
| 4 | Red pen | | 15.52 | 17.85 | | 25.00 |
| 5 | Box File | | 420.00 | 483.00 | | 1,250.00 |
| 6 | CR Book (Small) | 80pg | 160.00 | 184.00 | 40pg / 80pg | 145.00/ 260.00 |
| 7 | CR Book (Large) | 200pg | 365.00 | 419.75 | 160pg / 200pg | 495.00/ 595.00 |
| 8 | Carbon papers (Single side) | Universal | 1,420.00 | 1,633.00 | | |
| 9 | Cellotape 1" | 50m | 80.00 | 92.00 | | 295.00 |
| 10 | Cellotape 2" | 50m | 160.00 | 184.00 | | 410.00 |
| 11 | Clips | | 44.00 | 50.60 | | |
| 12 | Dot pin | | 65.00 | 74.75 | | |
| 13 | Computer sheet | 15x11 2ply | 19,500.00 | 22,425.00 | 1ply/2ply | 6200.00/ 13400.00 |
| 14 | Double tape 1" | | 80.00 | 92.00 | | |
| 15 | Double tape 2" | | 160.00 | 184.00 | | |
| 16 | Envelope 12x10 | Manila | 11.20 | 12.88 | | |
| 17 | Envelope 10x7 | Manila | 6.15 | 7.07 | | |
| 18 | Envelope 9x4 | Manila | 3.53 | 4.06 | | |
| 19 | Envelope 6x3 | Manila | 1.85 | 2.13 | | |
| 20 | Eraser | HB | 9.75 | 11.21 | Nataraj | 50.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 21 | Field Note Book | | 140.00 | 161.00 | | 180.00 |
| 22 | File Cover | | 11.70 | 13.46 | | 23.50 |
| 23 | File Lase | | 175.00 | 201.25 | | |
| 24 | Glue | | 255.00 | 293.25 | | 125.00 |
| 25 | Highligter pen | | 74.00 | 85.10 | | 180.00 |
| 26 | Ink Bottle | | 220.00 | 253.00 | | |
| 27 | Laminating Cover | A4 | 2,390.00 | 2,748.50 | | |
| 28 | Edmand File | | 97.00 | 111.55 | | |
| 29 | Pencil | | 18.75 | 21.56 | Nataraj | 30.00 |
| 30 | Foot Ruler | | 33.00 | 37.95 | | 45.00 |
| 31 | Stapler pin | | 57.00 | 65.55 | | |
| 32 | Tipex | | 122.00 | 140.30 | | |
| 33 | Typing Sheet | | 1,250.00 | 1,437.50 | | |
| 34 | Sticky note | | 90.00 | 103.50 | | 150.00 |
| 35 | GT53 Black ink | | 3,260.00 | 3,749.00 | | 2,900.00 |
| 36 | GT52 Colour ink | | 2,826.00 | 3,249.90 | | 2,900.00 |
| 37 | | | 2,826.00 | 3,249.90 | | 2,900.00 |
| 38 | | | 2,826.00 | 3,249.90 | | 2,900.00 |
| 39 | NPG 59 Toner | | 24,180.00 | 27,807.00 | | 12,500.00 |
| 40 | Printer Epson T774 | | 3,750.00 | 4,312.50 | | 2,925.00 |
| 41 | Hand Wash | | 695.00 | 799.25 | 4l | 2,400.00 |
| 42 | Soap | | 143.00 | 164.45 | | |
| 43 | Polythin 1 yard | 1kg | 950.00 | 1,092.50 | | |

උක්ත මිල ගණන් පිළිබද සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයිම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 02 ජල ගබඩාවට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම.

| No | Description | St. Anthony's Industries Group (Pvt) Ltd, P.O.Box 1455, No.752/1, Dr. Danister De Silva Mawatha, Colombo 09 | | | Mahanuwara Agencies, No.7, Kumara Veediya, Kandy | |
|---|---|---|---|---|---|---|
| | | Brand | Unit Price | With VAT | Brand | Unit Price |
| 1 | 20mm Socket With Pipe | ANTON | 398.18 | 457.91 | S LONE | 688.50 |
| 2 | 20mm Elbow | ANTON | 32.50 | 37.38 | S LONE | 51.00 |
| 3 | 20mm Valve Socket | ANTON | 37.92 | 43.61 | S LONE | 61.20 |
| 4 | 20mm Valve | ANTON | 309.60 | 356.04 | S LONE | 395.25 |
| 5 | 20mm Socket | ANTON | 29.80 | 34.27 | S LONE | 49.50 |
| 6 | 20mm Foucet Socket | ANTON | 35.21 | 40.49 | S LONE | 55.25 |
| 7 | 20mm End Cup | ANTON | 36.21 | 41.64 | S LONE | 55.25 |
| 8 | 25mm Pipe | ANTON | 893.87 | 1,027.95 | S LONE | 1,234.20 |
| 9 | 32mm Pipe | ANTON | 1,606.26 | 1,847.20 | S LONE | 1,759.50 |
| 10 | 32mm Socket | ANTON | 70.43 | 80.99 | S LONE | 110.50 |
| 11 | 32mm Elbow | ANTON | 73.13 | 84.10 | S LONE | 117.30 |
| 12 | 32mm Valve Socket | ANTON | 75.84 | 87.22 | S LONE | 119.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 13 | 32mm Valve | ANTON | 601.20 | 691.38 | S LONE | 773.50 |
| 14 | 32×20 T | ANTON | 102.93 | 118.37 | S LONE | 161.50 |
| 15 | 40mm Pipe | ANTON | 2,361.98 | 2,716.28 | S LONE | 3,763.80 |
| 16 | 40mm Valve Socket | ANTON | 119.18 | 137.06 | S LONE | 188.70 |
| 17 | 40mm Elbow | ANTON | 135.43 | 155.74 | S LONE | 216.75 |
| 18 | 40mm Valve | N/A | N/A | | S LONE | 1,181.50 |
| 19 | 40×20 T Socket | ANTON | 148.98 | 171.33 | S LONE | 234.60 |
| 20 | 50mm Pipe | ANTON | 3,391.29 | 3,899.98 | S LONE | 4,979.30 |
| 21 | 50mm Socket | ANTON | 143.56 | 165.09 | S LONE | 229.50 |
| 22 | 50mm Valve Socket | ANTON | 157.10 | 180.67 | S LONE | 250.75 |
| 23 | 50mm Valve | ANTON | 1,263.60 | 1,453.14 | S LONE | 1,619.25 |
| 24 | 50mm Elbow | ANTON | 213.99 | 246.09 | S LONE | 340.00 |
| 25 | 50×20 T Socket | ANTON | 189.61 | 218.05 | S LONE | 340.00 |
| 26 | 50×20 T Socket | ANTON | 189.61 | 218.05 | S LONE | 340.00 |
| 27 | 50×20 Clamp | ANTON | 734.25 | 844.39 | S LONE | 1,614.40 |
| 28 | 50mm Rubber Socket | N/A | N/A | | S LONE | 221.50 |
| 29 | 63mm Pipe | ANTON | 5,387.60 | 6,195.74 | S LONE | 8,013.80 |
| 30 | 63mm Socket | ANTON | 200.44 | 230.51 | S LONE | 319.60 |
| 31 | 63mm Elbow | ANTON | 325.04 | 373.80 | S LONE | 516.80 |
| 32 | 63mm Foucet Socket | ANTON | 232.95 | 267.89 | S LONE | 367.20 |
| 33 | 63mm Valve | N/A | N/A | | S LONE | 2,375.75 |
| 34 | 63×20 Clamp | ANTON | 821.32 | 944.52 | S LONE | 1,540.00 |
| 35 | 63×20 T Socket | ANTON | 452.35 | 520.20 | S LONE | 715.70 |
| 36 | 63 End Cup | ANTON | 186.90 | 214.94 | S LONE | 294.10 |
| 37 | 90mm Rubber Socket | N/A | N/A | | S LONE | 935.00 |
| 38 | 90mm Bend | ANTON | 2,655.49 | 3,053.81 | S LONE | 3,893.00 |
| 39 | 90mm Valve Socket | ANTON | 701.55 | 806.78 | S LONE | 1,100.75 |
| 40 | 90mm Foucet Socket | ANTON | 701.55 | 806.78 | S LONE | 1,113.50 |
| 41 | 90mm Valve | N/A | N/A | | S LONE | 6,472.75 |
| 42 | 90×63 T Socket | N/A | N/A | | S LONE | 2,006.00 |
| 43 | 90×20 Clamp | ANTON | 1,146.36 | 1,318.31 | S LONE | 2,128.00 |
| 44 | 110mm Socket | ANTON | 844.53 | 971.21 | S LONE | 1,266.50 |
| 45 | 110mm Bend | ANTON | 3,912.13 | 4,498.95 | S LONE | 5,729.00 |
| 46 | ගම් බෝතල් | ANTON | 1,877.13 | 2,158.70 | S LONE | 748.00 |
| 47 | ට්‍රේඩ්සීල් | ANTON | 130.00 | 149.50 | S LONE | 89.70 |
| 48 | කියත් තල | N/A | N/A | | S LONE | 325.00 |

| No | Description | K.S. De Silva & Son, 55, Main Street, Kurunegala | | New Central Stores & Distri (Pvt) Ltd, Slon Redistribution Center, No.4/A/1, Gangoda rd, Ambilmeegama, Pilimathalawa | |
|---|---|---|---|---|---|
| | | Brand | Unit Price | Brand | Unit Price |
| 1 | 20mm Socket With | ARPICO | 630.00 | S LONE (pnt 14) | 526.40 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | Pipe | | | | |
| 2 | 20mm Elbow | ARPICO | 51.00 | S LONE (pnt 11) | 42.00 |
| 3 | 20mm Valve Socket | ARPICO | 67.00 | S LONE ( pnt 11) | 50.40 |
| 4 | 20mm Valve | ARPICO | 350.00 | S LONE (Delux) | 397.50 |
| 5 | 20mm Socket | ARPICO | 52.50 | S LONE ( pnt 11) | 40.60 |
| 6 | 20mm Foucet Socket | ARPICO | 62.80 | S LONE ( pnt 11) | 45.50 |
| 7 | 20mm End Cup | ARPICO | 74.60 | S LONE ( pnt 11) | 45.50 |
| 8 | 25mm Pipe | ARPICO | 1,229.00 | S LONE ( pnt 11) | 999.05 |
| 9 | 32mm Pipe | ARPICO | 2,015.00 | S LONE ( pnt 11) | 1,400.75 |
| 10 | 32mm Socket | ARPICO | 119.00 | S LONE ( pnt 11) | 91.00 |
| 11 | 32mm Elbow | ARPICO | 126.00 | S LONE ( pnt 11) | 96.60 |
| 12 | 32mm Valve Socket | ARPICO | 114.00 | S LONE ( pnt 11) | 710.50 |
| 13 | 32mm Valve | ARPICO | 685.00 | S LONE (Delux) | 761.25 |
| 14 | 32×20 T | ARPICO | 173.00 | S LONE (pnt 11) | 133.00 |
| 15 | 40mm Pipe | ARPICO | 3,540.00 | S LONE (pnt 11) | 3,016.00 |
| 16 | 40mm Valve Socket | ARPICO | 227.75 | S LONE (pnt 11) | 155.40 |
| 17 | 40mm Elbow | ARPICO | 253.00 | S LONE (pnt 11) | 178.50 |
| 18 | 40mm Valve | ARPICO | 1,100.00 | S LONE (Delux) | 1,181.25 |
| 19 | 40×20 T Socket | ARPICO | 235.50 | S LONE ( pnt 11) | 193.20 |
| 20 | 50mm Pipe | ARPICO | 4,685.00 | S LONE ( pnt 11) | 3,965.00 |
| 21 | 50mm Socket | ARPICO | 260.50 | S LONE ( pnt 11) | 189.00 |
| 22 | 50mm Valve Socket | ARPICO | 298.30 | S LONE ( pnt 11) | 206.50 |
| 23 | 50mm Valve | ARPICO | 1,500.00 | S LONE (Delux) | 1,522.50 |
| 24 | 50mm Elbow | ARPICO | 392.50 | S LONE (pnt 11) | 280.00 |
| 25 | 50×20 T Socket | ARPICO | 357.00 | S LONE (pnt 11) | 158.20 |
| 26 | 50×20 T Socket | ARPICO | 245.50 | S LONE (pnt 11) | 280.00 |
| 27 | 50×20 Clamp | ANTON | 1,080.00 | S LONE (pnt 11) | 1,412.60 |
| 28 | 50mm Rubber Socket | NATIONAL | 2,475.00 | Non availabla | |
| 29 | 63mm Pipe | ARPICO | 7,540.00 | S LONE (pnt 11) | 6,357.00 |
| 30 | 63mm Socket | ARPICO | 518.00 | S LONE (pnt 11) | 262.50 |
| 31 | 63mm Elbow | ARPICO | 518.00 | S LONE (pnt 11) | 425.60 |
| 32 | 63mm Foucet Socket | ARPICO | 459.00 | S LONE (pnt 11) | 302.40 |
| 33 | 63mm Valve | ARPICO | 2,200.00 | S LONE (pnt 11) | 2,096.25 |
| 34 | 63×20 Clamp | ANTON | 1,270.00 | S LONE (pnt 11) | 1,347.50 |
| 35 | 63×20 T Socket | ARPICO | 812.50 | S LONE (pnt 11) | 158.20 |
| 36 | 63 End Cup | ARPICO | 335.00 | S LONE (pnt 11) | 242.20 |
| 37 | 90mm Rubber Socket | NATIONAL | 4,580.00 | S LONE (pnt 11)BEBF | 1,837.50 |
| 38 | 90mm Bend | ANTON | 4,117.00 | S LONE (pnt 11) | 3,206.00 |
| 39 | 90mm Valve Socket | ARPICO | 734.00 | S LONE (pnt 11) | 906.50 |
| 40 | 90mm Foucet Socket | ARPICO | 842.00 | S LONE (pnt 11) | 917.00 |
| 41 | 90mm Valve | S LONE | 6,800.00 | S LONE (Compact) | 5,711.25 |
| 42 | 90×63 T Socket | ANTON | 2,232.00 | S LONE (pnt 11) | 665.00 |
| 43 | 90×20 Clamp | ANTON | 1,876.00 | S LONE (pnt 11) | 1,862.00 |
| 44 | 110mm Socket | ARPICO | 1,608.00 | S LONE (pnt 11) | 1,043.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 45 | 110mm Bend | ANTON | 6,400.00 | S LONE (pnt 11) | 4,718.00 |
| 46 | ගම් බෝතල් | ARPICO | 2,793.00 | S LONE | 2,437.50 |
| 47 | ටෙෆ්ලෝන් | ANTON | 240.00 | Non availabla | |
| 48 | කියත් තල | CHINA | 50.00 | Non availabla | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 03 කාර්යාල ලඳුපත් මුද්‍රණය කිරීමට මිල ගණන් කැඳවීම.

| No | Description | රුවිර පොත් ප්‍රකාශකයෝ (පුද්) සමාගම, 6B, අලුත්ඔය, පිඹුරත්තාව, අරලගන්විල, පොළොන්නරුව | | Lanka Offset Printers, 223, D.S. Senanayaka Street, Kandy | | Thilina Printers, No.3, Madel Market,Gelioya | |
|---|---|---|---|---|---|---|---|
| | | එකවර මුද්‍රණය කරන ප්‍රමාණය | ඒකක මිල | එකවර මුද්‍රණය කරන ප්‍රමාණය | ඒකක මිල | එකවර මුද්‍රණය කරන ප්‍රමාණය | ඒකක මිල |
| 1 | කාර්යාල ලඳුපත් | | | 20 | 960.00 | කාබන් සහිත - 50 | 770.00 |
| | | 50 | 742.00 | 50 | 650.00 | කාබන් රහිත - 50 | 560.00 |
| | | 100 | 625.00 | 100 | 620.00 | | |
| 2 | අවසන් නිවේදන | | | 20 | 960.00 | | |
| | | 50 | 748.00 | 50 | 780.00 | | |
| | | 100 | 682.00 | 100 | 610.00 | කාබන් රහිත - 100 | 680.00 |

| No | Description | Tharindu Digital & Advertising, No.143, Kothmale rd, Nawalapitiya | | Rajah Press, Nawalapitiya | | උඩුදුම්බර ප්‍රාදේශීය සභාව, උඩුදුම්බර |
|---|---|---|---|---|---|---|
| | | එකවර මුද්‍රණය කරන ප්‍රමාණය | ඒකක මිල | එකවර මුද්‍රණය කරන ප්‍රමාණය | ඒකක මිල | ඒකක මිල |
| 1 | කාර්යාල ලඳුපත් | 20 | 725.00 | | | 575.00 |
| | | 40 | 637.50 | | | |
| | | | | 100 | 930.00 | |
| 2 | අවසන් නිවේදන | 10 | 643.20 | | 520.00 | |
| | | 20 | 525.00 | | | |
| | | | | | | |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය කාර්යාල ලඳුපත් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති Thilina Printers, No.3, Madel Market,Gelioya ආයතනයෙන් හා අවසන් නිවේදන සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති Rajah Press, Nawalapitiya යන ආයතනයෙන් අදාල මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

08 – 04 ගබඩාවට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට මිල ගණන් කැඳවීම.

| No | Description | Mahanuwara Agencies, No.7, Kumara Veediya, Kandy | Paperline Trading (Pvt) Ltd, No.14, Cross street, Kandy |
|---|---|---|---|

| | | වර්ගය | ඒකකයක මිල | වැට් රහිත | වැට් සහිත |
|---|---|---|---|---|---|
| 1 | අහල් 18 ක් දිග රබර් අත් වැසුම් ජෝඩුවක් | Sri Lanka | 600.00 | 374.00 | 430.10 |
| 2 | අහල් 8 ක් දිග රබර් + රෙදි මිශ්‍ර අත් වැසුම් ජෝඩුවක් | Sri Lanka | 150.00 | 144.00 | 165.60 |

උක්ත මිල ගණන් පිළිබඳ සලකා බැලූ ටෙන්ඩර් මණ්ඩලය උක්ත කාරණය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදී ගැනීම් සිදු කිරිම සුදුසු බවට ඒකමතිකව තීරණය කරන ලදී.

**09. වෙනත් කරුණු**

සාකච්ඡා කිරීමට වෙනත් කරුණු නොවූ බැවින් ගරු සභාපතිතුමා පැමිණ සිටි පිරිසට ස්තූතිය පළ කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 11.50 ට පමණ අවසන් කරන ලදී.

සභාපති,
පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය සභාව